# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2137/65 - 2019 අගෝස්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2019.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2018.05.02 දිනැති අංක 2069/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 3A පිටුවේ අංක 05 - 473 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩමට හිමිකම් කියන්නන්ගේ සම් සහ ලිපිනයන් ලෙස,

01. ගරුතර විහාරාධිපති ස්වාමීන් වහන්ස,
ශ්‍රී විජයසුන්දරාරාමය,
අස්ගිරිය,
මහනුවර.

02. මහා භාරකරු,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

සඳහන් වුවත්, අත්පත් යෝජනාවේ සඳහන් පරිදි, ඉඩමේ හිමිකරුවන් ලෙස, ඉහත සඳහන් දෙදෙනාට අමතරව, පහත නම් සහ ලිපිනයන් සහිත හතර දෙනා ද ඊට ඇතුළත් විය යුතු බව, මෙයින් ප්‍රකාශයට පත් කරමි.

01. කේ. ඩී. අයිරාංගනී පතිරණ මහත්මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

02. කේ. ඩී. නිද්‍රා අබේසේකර මහත්මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.


1A - G 30796 — 39 (2019/08)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. කේ. ඩී. සුමිත්‍රා අබේසේකර මහත්මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

04. නන්දා අබේසේකර මහත්මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 02 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය,
5/2/3/1372.

09 - 158

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ, කුරුඳුගහමඩ ඉහළ සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 02 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය,
5/2/1/1477.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 457, යහලතැන්න කන්ද, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, යහලතැන්න කන්ද ගමේ පිහිටි ''යහලතැන්න වත්ත '' නැමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 25ක් පමණ වන, පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

උපලේඛනය (සම්බන්ධිතයි)

ඉඩමේ නම : යහලතැන්න වත්ත

මායිම්

| | |
|---|---|
| *උතුරට* | : යහලතැන්න කන්ද සිට කුරුඳුගහමඩ දක්වා වැටී ඇති ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : යහලතැන්න කන්ද - කුරුඳුගහමඩ මාර්ගයේ සිට නිවාස දක්වා වැටී ඇති මාර්ගය ; |
| *දකුණට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

09 - 159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.